**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2020**
**-----------------------------------------------------------------**

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව අතර 2012 මැයි 18 දින එළඹි අංක 8145 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ II වගන්තිය (ආ.3) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**
**-----------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන සහ ජල සම්පාදන සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ කොළඹ මහනගර සභාව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ ජල ද්‍රෝණියේ ජල පෝෂක ප්‍රදේශයේ ජලගැල්ම අඩුකිරීම, කොළඹ අගනගරයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සහ තෝරාගත් ආදර්ශන ආයෝජනයන් මඟින් ප්‍රාදේශිය යටිතල හා සේවා වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම ව්‍යපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 42,031.74කට සමාන එ.ජ.ඩො. මිලියන 321ක් වන අතර ඉන් රු.මිලියන 27,890.22කට සමාන එ.ජ.ඩො මිලියන 213ක් මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 10 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝකර තිබුණි.

**1.3 මතය**
**------**

ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**
**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**--------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | විදේශ ණයවල පොලී ගෙවීම් වාර්තා කිරීමට ඒකාකාරී ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර **2016** සහ **2017** වර්ෂ සඳහා පොලී ගෙවීම් පිළිවෙලින් රු.මිලියන **68.54**ක් සහ රු.මිලියන **155.27**ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. | භාණ්ඩාගාරයෙන් අවසාන පොලී ගාස්තු නොමැතිවීම හේතුවෙන් **2018,2019** සහ **2020** මූල්‍ය වර්ෂවල පොලී ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර අදාළ ව්‍යාපෘති වියදම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ප්‍රමාද හානි ලෙස කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කර ගත් එකතුව රු.මිලියන **87.40**ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ලෙස වැරදියට දක්වා තිබුණි. | හිමිකම් නොපාන ලද ප්‍රමාද හානිවල ඉතිරි මුදල **2021** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගලපනු ලැබේ. | අදාළ ලෙජර් ගිණුම් ගැලපුම් කිරීමට පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසි සමග අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 751 | තත්කාලීන ගංවතුර පාලන උප ව්‍යාපෘතිය මගින් වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | වත්කම් ලේඛනය පවත්වාගෙන යනු ලැබේ. නමුත්, එහි අඩුපාඩු පවතින අතර නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | චක්‍රලේඛ උපදෙස් සමග අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ii) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛයේ 09 වගන්තිය | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශයේ උපදේශ අනුව 2020 වර්ෂයේදී සමාලෝචිත කමිටු රැස්වීම් පවත්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| | සංරචකය | 2020 දෙසැම්බර් 31 දිනට | | | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | අත්කර ගත් කාර්ය සාධනය භෞතික | මූල්‍ය | | | |
| (අ) | නව මුතුවෙල සහ ටොරින්ටන් උමග සැලසුම් කිරීම සහ ඉදිකිරීම | 100 | 76 | 66 | ඒවායේ සැලකිය යුතු ප්‍රමාදයන් හේතුවෙන් සමස්ථ ව්‍යාපෘති කාලය 2021 ජුනි දක්වා දීර්ඝ කිරීමට සිදු වී ඇති අතර පොදු මහජනතාව ඉදිකිරීම් කටයුතුවලින් අපහසුතාවන්ට පත්ව ඇත. තවද, පොදු මහජනතාව විසින් අපේක්ෂිත ප්‍රතිලාභ කාලීනව ළඟා කරගත නොහැකි වී ඇති අතර කටයුතුවල අපේක්ෂිත පිරිවැය ඉක්මවා ඇත. | 2020 ආරම්භයේදී කොවිඩ් බලපෑම නොසලකමින් මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. ලෝක සෞඛ්‍ය සංවිධානය 2020 මාර්තු ගෝලීය වංසගත තත්ත්වයන් ප්‍රකාශයට පත් කළ අතර වර්තමානයේ පවා (2021 4 වන කාර්තුවේ) අපි එම තත්ත්වයේම සිටි. ව්‍යාපෘතියට කොවිඩ් 19 බලපෑම විශාල වු අතර එය ව්‍යාපෘතියේ ප්‍රගතියට බාධාවක් විය. | සැලසුම් කළ කොන්ත්‍රාත් කාලය තුළ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය මගින් කොන්ත්‍රාත් කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) | කෝට්ටෙ කොටුබැම්ම ජෛව විවිධත්ව උද්‍යානය සංවර්ධනය | 80 | 100 | 72 | | | |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ශාන්ත සෙබස්තියන් උතුරු ඇලමාර්ගයේ ජල අගුළු දොරටු සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම | **100** | **96** | **91** |
| (ඇ) | කොළොන්නාව ඇළ හැරවීමේ යෝජනා ක්‍රමය අදියර I | **100** | **89** | **78** |
| (ඉ) | අඹතලේ වැසි ජලය පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරිම | **100** | **89** | **78** |
| (ඊ) | මාදිවෙල නැගෙනහිර හැරවුම් යෝජනාක්‍රමය අදියර III | **100** | **98** | **75** |
| (උ) | නොරිස් ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | **100** | **80** | **64** |
| (ඌ) | කොළොන්නාව ඇළ හැරවීමේ යෝජනා ක්‍රමය අදියර IV | **100** | **83** | **77** |
| (එ) | ශාන්ත සෙබස්තියන් දකුණු ඇල මාර්ගයේ ජල අගුළු දොරටු පොම්පාගාරයේ පිරියත සැලසුම් කිරීම, සැපයීම සහ ස්ථාපනය | **100** | **86** | **64** |

**3.2** **ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ ප්‍රමාදයන්**

| | ක්‍රියාකාරකම් | නිම කිරීමට අපේක්ෂිත දිනය | භාර ගත් දිනය | ප්‍රමාදය (දින) | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | නොරිස් ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම | 2019 අගෝස්තු 22 | කටයුතු 2021 මැයි 05 දින වන විටත් භාරදී තිබුණි. | 590 | වැඩබිමෙහි අයිතිය භාරදීමේ ප්‍රමාදය හේතුවෙන් නොරිස් ඇළ හැරවුම් පෙට්ටි කාණුවල කටයුතු ආරම්භ කර නොතිබුණි. | කටයුතු කඩිනම් කිරීමට සහ කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණ කළ යුතුය. |
| (ආ) | ශාන්ත සෙබස්තියන් උතුරු ඇලමාර්ගයේ ජල අගුළු දොරටු සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම | 2019 ජුනි 30 | කටයුතු 2021 මැයි 05 දින වන විටත් භාරදී තිබුණි. | 485 | ගංවතුර, අපහපත් කාලගුණය, පාස්කු ප්‍රහාරය සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ප්‍රමාදයන් සිදු වී ඇත. | -එම- |
| (ඇ) | මාදිවෙල නැගෙනහිර හැරවුම් යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම අදියර III | 2018 ජනවාරි 10 | කටයුතු 2021 මැයි 05 දින වන විටත් භාරදී තිබුණි. | 1,125 | අධිබලැති විදුලි රැහැන් මාරු කිරීමේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අඹතලේ සිට ජලය සපයන ජල පිරිපහදු නල එලීමේ ප්‍රමාදයන් හේතුවෙන් උප ව්‍යාපෘති ප්‍රමාද විය. | -එම- |
| (ඈ) | කොළොන්නාව ඇළ හැරවීමේ යෝජනා ක්‍රමය අදියර - I | 2020 අප්‍රේල් 29 | කටයුතු 2021 මැයි 05 දින වන විටත් භාරදී තිබුණි. | 365 | විකල්ප මාර්ගය නිම කිරීමේ ප්‍රමාදය, අභයපත් කාලගුණය සහ උපයෝගීතා සේවා මාරු කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් උප ව්‍යාපෘතිය ප්‍රමාද වි තිබුණු අතර ව්‍යාපෘතිය නිමකර, 2020 මැයි 05 දින භාරදී තිබුණි. | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඉ) | නව මුතුවෙල සහ ටොරින්ටන් උමග ඉදිකිරීම | 2020 මැයි 30 | කටයුතු 2021 මැයි 05 දින වන විටත් භාරදී තිබුණි. | 335 | අපි කාර්යබහුල තත්ත්වයක් යටතේ කටයුතු කරන නිසා මෙම වර්ෂය තුළ ව්‍යාපෘතිය (ටොරින්ටන් උමග) නම කිරීමේ අවිනිශ්චිතාවයක් පවතී. | -එම- |
| (ඊ) | කොට්ටේ කොටුබැම්ම ජෛව විවිධත්වයෙන් යුතු උද්‍යානයක් සංවර්ධනය | 2020 දෙසැම්බර් 02 | කටයුතු 2021 මැයි 05 දින වන විටත් භාරදී තිබුණි. | 436 | ප්‍රමාදයට කොවිඩ් 19 ගෝලීය වසංගතයේ සෘජු සහ වක්‍ර බලපෑම් ඇති විය. | -එම- |
| (උ) | කොළොන්නාව ඇළ හැරවීමේ යෝජනා ක්‍රමය අදියර - IV | 2020 ජූලි 28 | කටයුතු 2021 මැයි 05 දින වන විටත් භාරදී තිබුණි. | 245 | පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේ අනපේක්ෂිත ප්‍රතිඵල සහ සේවක හිඟය, පාර්ලිමේන්තු ජන්දය, කොවිඩ් 19 වංසගතය වැනි හේතූන් නිසා කොන්ත්‍රාත්තුව ප්‍රමාද විය. | -එම- |
| (ඌ) | ශාන්ත සෙබස්තියන් දකුණු ජල අගුළු දොරටු පොම්පාගාරයේ පිරියත සැලසුම් කිරීම සහ ස්ථාපනය කිරීම | 2020 සැප්තැම්බර් 30 | කටයුතු 2021 මැයි 05 දින වන විටත් භාරදී තිබුණි. | 215 | මුල් කොන්ත්‍රාත් නිම කිරීමේ දිනට 2020.10.18 දින දක්වා දීර්ඝ කර ඇත. | -එම- |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් ප්‍රදාන කිරීමේ ප්‍රමාදය සහ පාස්කු ඉරු දින ප්‍රහාරය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ටොරින්ටන් සහ නව මුතුවෙල උමං ඉදිකිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 65 සහ සියයට 88 විය. ඉදිකිරීම් 2020 මැයි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, එය 2021 නොවැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. එම නිසා, එදිනට කටයුතු නිමකිරීම සැකසහිත වේ. | අත්සන් කරන ලද කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව, පවතින තත්ත්වය සැලකීමෙන් පසු වර්තමානයේ ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය දීර්ඝ කිරීම් 2021 දෙසැම්බර් 21 දක්වා ලබාදී ඇත. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර ඉදිකිරීම් කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | ශාන්ත සෙබස්තියන් උතුරු ජල අගුළු දොරටු සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම, අඹතලේ වැසි ජල පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම, කෝට්ටේ කොටුබැම්ම ජෛව විවිධත්ව උද්‍යානය සංවර්ධනය, කොලොන්නාව ඇළ හැරවීමේ යෝජනා ක්‍රම අදියර I සහ අදියර IV යනාදී රු. මිලියන 6,760.52ක් වටිනා කොන්ත්‍රාත් 05ක ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී නිම කිරීමට එකඟ වූවද එකඟ පරිදි නිම කර නොතිබුණි. | ගංවතුර යටවීම සහ අයහපත් කාලගුණ තත්ත්වය, පාස්කු ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය වැනි විවිධ හේතූන් නිසා උප ව්‍යාපෘති 06ක නිමකිරීම් ප්‍රමාද විය. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර ඉදිකිරීම් කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | නොරිස් ඇළ මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 21 දින රු.මිලියන 353 ක පිරිවැයකට පිරිනමා තිබුණු අතර 2019 අගෝස්තු 23 දින වන විට නිම කිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 78 සහ සියයට 58 ඉදිකිරීම්වල මන්දගාමී භෞතික හා මූල්‍ය ප්‍රගතියක් විය. තවද, ආර්නෝල්ඩ් රත්නායක මාවතේ සීඑම්සී ගොඩනැගිල්ල කඩා දැමීමේ කටයුතු 2021 මැයි 05 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. එමනිසා, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී, ඉදිකිරීම් කටයුතු නිම කිරීම පිළිබඳ සැකසහිත වේ. | වලංගු හේතූන් නිසා උප ව්‍යාපෘති ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය ප්‍රමාද වූ අතර මන්දගාමී ප්‍රගතියක් පෙන්වීය. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර ඉදිකිරීම් කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ඈ) | ව්‍යාපෘතිය විසින් 2017 අගෝස්තු සිට තත්කාලීන ගංවතුර පාලන පද්ධතිය සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට උපදේශකවරයකු ලබා ගෙන තිබුණු අතර 2020 ජුනි 30 දක්වා දීමනා ලෙස රු. මිලියන 32.9ක් ගෙවා තිබුණි. කෙසේ | පැහැදිලි පිළිතුරක් ලබා දී නොමැත. | ව්‍යාපෘතියේ අරමුණු සමග අනුගතවීම අවශ්‍ය අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය |

| | | | |
|---|---|---|---|
| | වෙතත්, කටයුතු නිම කිරීමකින් තොරව ක්ෂණිකව උපදේශකවරයාගේ සේවය නවතා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියට උපදේශකගෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. | | අවම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | බම්බලපිටිය සහ කොල්ලුපිටිය මගී ගුවන් පාලම සැලසුම් කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශන කොන්ත්‍රාත් දෙක රු.මිලියන 27.22ක පිරිවැයකට 2013 දෙසැම්බර් මස සමාගමක් වෙත පිරිනමා තිබුණි. මහා නගර ප්‍රධාන සැලැස්ම සමග ඉදිකිරීම් අනුගත නොවන බව සමාගම දැනුවත් නොකර උපදේශන ගාස්තු රු. මිලියන 16.79 ක් ගෙවා තිබුණි. | පැහැදිලි පිළිතුරක් ලබා දී නොමැත. | අරමුණු සමග අනුකූලවීම අවශ්‍ය වේ. |

**3.4 ව්‍යාපෘතියේ අරමුණුවලින් පරිබාහිරව කරන ලද ගෙවීම්**

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස අමාත්‍යාංශය විසින් දරන ලද එකතුව රු. මිලියන 5.96ක ප්‍රචාරන ගාස්තු ව්‍යාපෘති වියදමක් ලෙස ව්‍යාපෘති ගිණුම්වලට ගිණුම්ගත කර තිබුණි. | ජේඊ/02/01/2020 අනුව, මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් දරන ලද රු.මිලියන 5.96 ක ප්‍රචාරණ ගාස්තු ප්‍රචාරණ වියදම් ලෙස අමාත්‍යාංශයේ මූල්‍ය වාර්තාවල ගිණුම්ගත කර තිබුණු අතර පසුව අමාත්‍යාංශයේ ගිණුම් පියවන අවස්ථාවේදී රජයේ වියදමට අයකර තිබුණි. | ව්‍යාපෘතියේ විෂය පථය සමග අනුකූලවීමට අවශ්‍ය වේ. |

**3.5 නොවිසඳී පවතින පෙර විගණන වාර්තාවල පෙන්වා දෙනු ලැබූ ගැටලු**

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | තත්කාලීන ගංවතුර පාලන ඒකකයක් ස්ථාපනය සඳහා රු. මිලියන 06ක පිරිවැයකට බත්තරමුල්ල ප්‍රදේශයේ නිවසක් කුලියට ගෙන තිබුණි. කෙසේවෙතත්, එම අරමුණු සඳහා මෙම ගොඩනැගිල්ල භාවිතයකින් තොරව බත්තරමුල්ල සෙත්සිරිපාය II | තත්කාලීන ගංවතුර පාලන මධ්‍යස්ථාන 2016 බත්තරමුල්ලේ කුලියට ගත් කුඩා ප්‍රමාණයක ගොඩනැගිල්ලක ආරම්භයේදී ස්ථාපනය කර තිබුණි. කටයුතු ව්‍යාප්ත කිරීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2017 දී සෙත්සිරිපාය 10 වැනි මහලේ සී අංශයේ කොටසකුත් කුලියට ගත් අතර තත්කාලීන ගංවතුර පාලන ඒකකයෙහි | ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදියරේ කුලියට ගත් ඉඩ සඳහා කුලිය, විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් සඳහා එකතුව රු. මිලියන 10.43ක් ගෙවා තිබුණි. | කටයුතු පියවරෙන් පියවර ව්‍යාප්ත කර ඇත. | |
| (ආ) | ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 දක්වා තත්කාලීන ගංවතුර පාලන පද්ධතියේ සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීමට එකතුව රු. මිලියන 164.6ක් දරා තිබුණද, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය 2021 දෙසැම්බර් 31 නිසා සම්පූර්ණයෙන් සංවර්ධනය කළ තත්කාලීන ගංවතුර පාලන පද්ධතිය නිම කර නොමැත. | පද්ධතිය අදාළ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ලැබී තිබුණු තොරතුරු අනුව, කිරි මණ්ඩල මාවත, කොළඹ 05 හි පිහිටි ගංවතුර පාලනය සහ ජල කළමනාකරණය සඳහා වන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු විගණිත දිනය වූ 2021 මැයි 05 වන විටත් නිමකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, නව ගොඩනැගිල්ලේ තත්කාලීන ගංවතුර පාලන පද්ධතිය ස්ථාපනය කිරීමේ කටයුතු විගණිත දිනය වූ 2021 මැයි 05 දින වන විටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. මෙම හේතුව නිසා රු. මිලියන 92.15ක පිරිවැයකට මිලදී ගත් මෙම පද්ධතියට අදාළ පරිගණක, පරිගණක තිර(monitor), දත්ත ගබඩා(servers) වැනි මෙම පද්ධතියට සම්බන්ධ උපාංග සවි කිරීමට ස්ථිර ස්ථානයක් නොතිබුණි. තවද, ඉහත ගොඩනැගිල්ල නිම නොකිරීම හේතුවෙන් මෙම පද්ධතියට අදාළ රු. මිලියන 643.3ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද කිරීමට සිදු වූ බව අනාවරණය විය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට සිදුවේ. ඉහත ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද අරමුදල් උපයෝජනයට නොහැකිවීම පිළිබඳව විගණනයේදී සැක පවතී. | ප්‍රතිචාර 4.6 (ඇ) යටතේ සඳහන් පරිදි මිලදී ගත් උපාංග/උපකරණ වන මහලේ තත්කාලීන ගංවතුර පාලන පද්ධතිය ඒකකයේ සවිකර සහ/හෝ එළිම සිදු කර ඇති අතර ඉදිකිරීම් අවසන් වූ විට නව ගොඩනැගිල්ල වෙත මාරු කරනු ලැබේ. නව ගොඩනැගිල්ල නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් සමහර ප්‍රසම්පාදනයන් ප්‍රමාද කිරීමට සිදු වූ බව පිළිගනු ලැබේ. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කිරීමට වගකිව යුතු පාර්ශවයන් පෙළඹවීමට පියවර ගත යුතුය. |